# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2297/78 - 2022 සැප්තැම්බර් මස 16 වැනි සිකුරාදා - 2022.09.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, ම විසින් 2022 ජූලි මස 22 දිනැති අංක 2289/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය, 2022 සැප්තැම්බර් මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2022 සැප්තැම්බර් මස 16 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි "අංක 02. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(*අ*) එහි I වැනි තීරුවෙහි අංක 32 අයිතමය ඉවත් කිරීමෙන්;

(*ආ*) එහි II වැනි තීරුවෙහි අංක 26, 50 සහ 51 අයිතමයන් ඉවත් කිරීමෙන්;

(*ඇ*) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන්;

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත (1979 අංක 40)
- මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (1978 අංක 4) (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නීතිය)
- කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත (2021 අංක 11)

(2) එම නිවේදනයෙහි "අංක 06. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 10 අයිතමයට පසුව පහත සඳහන් අයිතමය ඇතුලත් කිරීමෙන්;

11. ජාතික යහපත සහ ආර්ථික දියුණුව අරමුණු කරගෙන විශේෂිත යටිතල සහ අනෙකුත් පහසුකම් සහිත ජාත්‍යන්තර ව්‍යාපාර හා සේවා කේන්ද්‍රස්ථානයක් වශයෙන් කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය සංවර්ධනය කිරීම

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 11 සහ 12 අයිතමයන් පිළිවෙලින් අංක 12 සහ 13 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 4 අයිතමයට පසුව පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන්;

5. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
6. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
7. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව

(ඈ) එහි III වැනි තීරුවෙහි"අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)" අයිතමයට පසුව පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන්;

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත (1979 අංක 40)
- මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (1978 අංක 4) (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නීතිය)
- කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත (2021 අංක 11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.